---

**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 05 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇත රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.1,542,150 ක් උසාවි දඩ ආදායම් ලෙසද, සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම් රු.170,350 ක් මුද්දර ගාස්තු ආදායම් ලෙසද ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.171,913 ක උසාවි දඩ සහ රු.71,493 ක මුද්දර ගාස්තු ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම් ණයගැතියෝ සහ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.243,406 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු උසාවි දඩ ආදායම සහ සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) පසුගාමී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ වැඩසටහන යටතේ නව ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතයේ පළමු අදියර සඳහා අවස්ථා හතරකදී දරන ලද රු.4,136,575 ක් වූ වියදම් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,756,250 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,190,526 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 437,209 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1 | - | - |
| (ii) | බදු කුලී | 1,545 | 1,264 | 28 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 715 | 787 | - |
| (iv) | වෙනත් ආදායම් | 16,965 | 2,635 | 4,512 |

### 2.2.2 බදු කුලී

2009 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කරන ලද තක්සේරු වාර්තාවට අනුව කුලී අය නොකර 2009 දෙසැම්බර් 30 දිනැති මහා සභාවේ තීරණයක් මත කඩ කාමර සඳහා මාසික තක්සේරු බදු කුලියෙන් සියයට 40 ක් බැගින් අයකරමින් පැවතුනි.

------------------------------------------------------------------------------------------------------------------------------------------------

### 2.2.3 බලපත්‍ර ගාස්තු

(අ) සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර අයකර ගත යුතු වෙළඳ ආයතන හඳුනාගැනීම සඳහා වර්ෂය ආරම්භයේ දී වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් කර නොතිබුණි.

(ආ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත, ව්‍යාපාර ආදිය සමීක්ෂණයක් මගින් හඳුනාගැනමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 170,350 |
| (ii) | මුද්දර ගාස්තු | 1,542,150 |

### 2.3 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

(අ) හමුදා ක්‍රියානවිත රාජකාර සඳහා රැගෙන ගොස් නැවත 2008 මාර්තු 18 දින සභාව වෙත භාරදී තිබූ කැබ් රථය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර එදින සිටම නිෂ්ක්‍රියව සභා භූමියේ රඳවා තිබුණි.

(ආ) 2005 මාර්තු 01 දින බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවෙන් ලබාදී තිබූ ත්‍රීවිල් පිකප් රථය 2012 මාර්තු මාසයේ සිට කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදා නොගෙන සභා භූමියේ රඳවා තිබුණි.

(ඇ) සභාව සතු කාමර දෙකකින්, සාලයකින් හා මුලුතැන්ගෙයකින් සමන්විත නිල නිවාස 2 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවැතුනි.

### 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබාගිය හා මිය ගිය සේවකයින් 09 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින රු.25,407 ක් වන සේවක ණය අයකර ගැනීමට ආයතන සංග්‍රහය xxiv වන පරිච්ඡේදයේ 1:4 හා 6 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2) වගන්තිය හා 1990 අංක 28 දරන පළාත් සභා සංශෝධිත පනතේ 32(2අ) වගන්තිය ප්‍රකාරව, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා තිබුණ ප්‍රාදේශීය සභාවල කණිෂ්ඨ සේවකයින් බඳවාගැනීමේ බලතල 2005 අප්‍රේල් 21 දින ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති විසින් පළාත් පාලන කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ඇතිව බඳවාගැනීමේ පටිපාටි හා චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත පවරා තිබුණි. මෙම බලතල ඉක්මවා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2011 ඔක්තෝබර් 21 දින ආදේශක පුස්තකාල සහායක තනතුරකට සේවකයෙක් බඳවාගෙන එදින සිට 2013 පෙබරවාරි මාසය දක්වා ප්‍රාදේශීය සභා අරමුදලින් රු.188,862 ක් වැටුප් ගෙවා තිබුණි.

## 2.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බල ප්‍රදේශය තුල විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය